# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2020

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

## பொதுத் தொழில்முயற்சிகள் திணைக்களம்

நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில் முயற்சி மறுசீரமைப்பு

இராஜாங்க அமைச்சர்

## Department of Public Enterprises

**State Ministry of Money and Capital Market and State Enterprise Reforms**

# අන්තර්ගතය

**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 5

**පරිච්ඡේදය 03 – 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 6

3.3 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 8

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 9

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 11

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 12

3.8 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන 12

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 12

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව 13

**පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම පදනම්ව) 24

**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 26

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 31

6.3 මානව සම්පත් සංවර්ධනය 31

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව**

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි[1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මුල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය,ජලය,බැංකු හා රක්ෂණ,පොදු ප්‍රවාහන,ගුවන් සේවා හා ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යාපාර 417 ක් අතරින් ව්‍යාපාර 49 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යාපාර[2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යාපාරවලින් 300 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යාපාර 117 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

**අරමුණු**

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම

1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.
2.සේවා සහ භාණ්ඩ විකිණීම මගින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාලව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

## 1.4. සංවිධාන සටහන

| | | |
|---|---|---|
| අ.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| අ | - | අධ්‍යක්ෂ |
| නි.අ | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ | - | සහකාර අධ්‍යක්ෂ |
| පරි.නි | - | පරිපාලන නිලධාරී |
| සං. නි | - | සංවර්ධන නිලධාරී |
| මූ.වි | - | මූල්‍ය විශ්ලේෂක |
| කළ. ස | - | කළමනාකරණ සහකාර |
| කා.කා.ස | - | කාර්යාල කාර්ය සහායක |



1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

- කෘෂි කාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කාර්මික අංශය
- පාලන හා ගිණුම් අංශය

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

අදාල නොවේ

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නොවේ

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

## 02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### අභියෝග හා ඉදිරි ඉලක්ක

- රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය වැඩි කිරීමෙහිලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම.
- මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙන්ම රාජ්‍ය ව්‍යාපාර වල කළමනාකරණය දැනුවත් කර ඔවුන්ගේ හැකියා මට්ටම් වර්ධනය කිරීම කළ යුතු වේ.
- මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව තුළ පුහුණු කිරීම් මෙන්ම රාජ්‍ය ව්‍යාපාර කළමනාකරුවන්ට අවශ්‍ය පුහුණු සඳහා පෙළඹවීම්, සම්බන්ධීකරණය කිරීම ප්‍රධාන අරමුණ වේ.
- රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය වර්ධනය කිරීමද මූලික ඉලක්කයක් වන අතර මේ සඳහා යහපාලන මාර්ගෝපදේශ නිකුත් කිරීම මෙන්ම පුහුණු සැසි පැවැත්වීම අවශ්‍ය වේ.
- මේ සඳහා කාලය හා සම්පත් කළමනාකරණය කරගැනීම අභියෝග ලෙස හදුනා ගත හැක.

## 03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

**2020 දෙසැම්බර් 31දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2020 | | සටහන | තතය 2020 | 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම** | | 17,623,951,941 | 30,968,467,689 | |
| - | ආදාම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ -1 |
| - | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 17,623,951,941 | 30,968,467,689 | |
| - | **මුළු ආදයම් ලැබීම් (අ)** | | 17,623,951,941 | 30,968,467,689 | |
| | **ආදයම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 31,413,874,856 | 6,273,760,554 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 70,644 | 65,600 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,233,903 | 6,819,187 | ඒසීඒ - 5/5(අ) |
| - | වෙනත් ලැබීම් | | 4,221,869 | 20,494,023,944 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **31,424,401,272** | **26,774,669,285** | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **48,048,353,213** | **57,743,136,974** | |
| | **අඩු කළා: වියදම** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 72,450,000 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 64,522,470 | 62,664,141 | |
| 318,400,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 16,291,543 | 1,475,750,028 | ඒසීඒ - 2(II) |
| 264,700,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 243,823,123 | 64,799,424 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 655,550,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **324,637,136** | **1,603,213,593** | |
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | **10** | | 669,441 | |
| 3,600,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 421,355 | 705,763 | **ඒසීඒ - 2(II)** |
| **-** | ප්‍රාග්ධන පැවරීම් | **12** | - | - | |
| 58,683,500,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | 51,418,407,751 | 24,910,680,958 | |
| 1,000,000 | හැකියා වර්ධනය | **14** | 657,000 | 1,900,955 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | 250,000,000 | |
| **58,688,100,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **51,419,486,106** | **25,163,957,117** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **4,887,373** | **6,320,843** | |
| | **තැන්පතු ගෙවීම්** | | 109,319 | 20,725 | **ඒසීඒ -4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 4,778,054 | 6,300,118 | **ඒසීඒ - 5/5(අ)** |
| 59,343,650,000 | **මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)** | | **51,749,010,615** | **26,773,491,553** | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(2,700,657,402)** | **30,969,645,421** | |

## 2020 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 35,009,992 | 34,588,638 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 12,966,600 | 14,422,448 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **47,976,592** | **49,011,086** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම | | 12,960,400 | 14,377,573 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 35,009,992 | 34,588,638 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | | |
| **<u>ජංගම වගකීම්</u>** | - | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 6,200 | 44,875 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **47,976,592** | **49,011,086** |

පිටු අංක 03සිට 21 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 22 සිට 28දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ ගැලපීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2021 . 02 . 25 | දිනය : | දිනය : 05/03/2021 |
| R. M. A. Ratnayake<br>Secretary<br>State Ministry of Money & Capital Market and State Enterprise Reforms. | P. A. Susantha Athula Kumara<br>Director General<br>Department of Public Enterprises<br>General Treasury<br>Colombo 01. | Jayantha R. Randeniya<br>Deputy Director<br>Department of Public Enterprises<br>General Treasury<br>Colombo 01 |

**3.4** මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ-සී**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**

**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | සතත්‍ය | |
|---|---|---|
| | **2020** | **2019** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදයම් නොවන ලැබීම් | 528,019 | 3,985,461 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 31,413,874,856 | 6,273,760,554 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **31,414,402,875** | **6,277,746,015** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 78,499,071 | 1,539,574,568 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | 243,823,123 | 64,799,424 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 471,272 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 9,044,816 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **322,322,194** | **1,613,890,080** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-( ආ)** | **31,092,080,681** | **4,663,855,935** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | | |
| අත්තිකාරම් අය කර ගැනීම | 2,870,051 | 7,114,702 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **2,870,051** | **7,114,702** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 31,092,662,517 | 4,664,715,395 |
| අත්තිකාරම් ගෙවීම් | 2,249,540 | 6,300,117 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **31,094,912,057** | **4,671,015,512** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(31,092,042,006)** | **(4,663,900,810)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | **38,675** | **(44,875)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 70,644 | 65,600 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **70,644** | **65,600** |
| ***<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>*** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 109,319 | 20,725 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **109,319** | **20,725** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(38,675)** | **44,875** |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

**3.5** **මූල්‍ය ප්‍රකාශ සටහන්**

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

   2020දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.6** **ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය**

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.03.00 | ලාභ | 44,673,000 | 30,961,000 | 14,768,453 | 48 |
| 2002.04.00 | ලාභාංශ | 5,471,000 | 4,918,000 | 2,855,499 | 58 |
| 2006.01.00 | වෙනත් | - | - | 4,328 | - |

**3.7** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 605,550 | 655,550 | 324,637 | 50 |
| ප්‍රාග්ධන | 28,608,100 | 58,688,100 | 51,419,486 | 88 |

**3.8** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| ---- | මැතිවරණ දෙපාර්තමේන්තුව | මැතිවරණ රාජකාරී දීමනා | 495,533 | 495,533 | 495,533 | 100 |

**3.9** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1047 | 1047 | නැත | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 33,962 | 33,962 | නැත | 100% |
| 9153 | ඉඩම් | අදාළ නොවේ | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } TRE/A/PED/02/20/01    ඔබේ අංකය / உமது இல. / Your No }    දිනය / திகதி / Date } 2021 ජූනි 22 දින

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව,**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 22 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානුචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(i) පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයක් සඳහා වෙන්කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කාලපරිච්ඡේදය තුළ වැය නොකර වර්ෂය අවසානයේ සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි.

(ii) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී එක් වැය විෂයයක විචලතාවය සියයට 25 ක් විය.

(iii) පුනරාවර්තන වැය විෂයයන් 08 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iv) 2020 වර්ෂය තුළ 2301 - හිමිකම් දායක මුදල් වැය විෂයය යටතේ ලබාදී තිබූ සමාගම් 02 ක් සඳහා වූ ආරම්භක ප්‍රාග්ධනයට අදාළ රු.40,000,000 ක් වූ චෙක්පත් පහත සඳහන් සමාගම් සංස්ථාපනය කළද, මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැති වීම හේතුවෙන් 2021 ජූනි 16 වන තෙක් අදාළ පාර්ශවය වෙත භාරදී නොතිබුණි.

(අ) Center for Excellence Robotics Applications (pvt) Ltd.
(ආ) Sahasya Investments Ltd.

(v) සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක ප්‍රාග්ධනයක් ලෙස රු.48,000,000,000 ක් ලබාදී තිබුණද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

(vi) දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාර වෙත සිදුකරන ලද ප්‍රාග්ධන දායකත්වය, අදාල ආයතන විසින් නිවැරදිව ගිණුම් ගත කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් මඟපෙන්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය නොවීය.

(vii) එසේම, රජය විසින් ලබාදෙනු ලබන පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම පිළිබඳව නිසි අධීක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය නොවීය.

## 2.2 ආදායම් කළමනාකරණය

### 2.2.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

(අ) මූලය ප්‍රකාශන අනුව 2002:03:00 ආදායම් සංකේතයේ හා 2002:04:00 ආදායම් සංකේතයේ දක්වා ඇති මූලික ඇස්තමේන්තුව හා 2020 වර්ෂයේ අනුමත මූලික ඇස්තමේන්තුව අතර රු.මි. 28,173 ක සහ රු.මි.1,971 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති බවට ගිණුමේ දක්වා ඇතත් ඊට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) ඒ අනුව එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම් පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

#### I. ආදායම් සංකේතාංකය 20:02:03-ලාභ

i 2020 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. 30,961,000,000 වූ අතර සත්‍ය ආදායම රු.14,768,452,766 ක් වීම හේතුවෙන් එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 48 ක් වී තිබුණි.

ii. ආයතන 7 කට අදාලව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සත්‍ය ආදායමේ අඩුවීම සියයට 33 ත් 84 ත් අතර පරාසයක පැවතුණි.

iii. ආයතන 12 ක් මගින් 2020 වර්ෂය තුළදී රු. මිලියන 1,398 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් එකී ආයතන විසින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

iv. ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය හා ජාතික ලොතරැයි මණ්ඩලය යන ආයතන 03 න් පසුගිය වර්ෂ 03 කට අධික කාලයක සිට ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.

v. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, මහජන බැංකුව විසින් 2020 වර්ෂය සඳහා අනුමත කරන ලද රු. බිලියන 01 ක් වූ අතතුරු වට්ටම, ශ්‍රී ලංකා සමාගම වෙනුවෙන් නිකුත් කර තිබූ රු. මිලියන 1,650 ක සහන ලිපියට අදාල පොළිය රු. 909,100,000 ක් හා ප්‍රාග්ධන මුදලින් රු. 90,900,000 ක් නිරවුල් කිරීම භාවිතා කරන ලද බව මහජන බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙත දන්වා තිබුණි. ඒ අනුව එම නිරවුල් කිරීම 2020 දෙසැම්බර් 31 දිනැතිව වාරු පත්‍රයක් මගින් ගිණුම්වලට ගලපා තිබුණි.

## II ආදායම් සංකේතාංකය 20.02.04 - ලාභාංශ ආදායම

i. 2020 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.4,918,000,000 වූ අතර සත්‍ය ආදායම රු. 2,855,499,175 ක් වීම හේතුවෙන් එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 58 කි.

ii. ආයතන 2 කට අදාලව ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 65 සිට සියයට 80 දක්වා පරාසයකින් සත්‍ය ආදායම් අඩුවී තිබුණි.

iii. 2020 වර්ෂය සඳහා ආයතන 14 ක් රු. මිලියන 1,074 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර එම ආයතනවලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි.

iv. පහත සඳහන් ආයතන පසුගිය වර්ෂ කිහිපය තුළ ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.

- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
- කහටගල ග්‍රැෆයිට් ලංකා සමාගම
- ලංකා සීනි සමාගම
- ලංකා ලොජිස්ටික් සමාගම
- ලංකා ත්‍රිපෝෂ සමාගම

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කළයුතු වුවත් විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබීම හේතුවෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම රු. 6,233,903 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු. 2,870,051 ක් වීමෙන් රු. 3,363,852 කින් මුදල් ගලාඒම අඩුවෙන් දක්වා තිබුණි.

ii. අත්තිකාරම් ගෙවීම් රු. 4,778,054 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.2,249,540 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 2,528,514 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මගින් පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසුවිපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහය වීම යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාවේ 01 වන පරිච්ඡේදයේ 1.1 හි සහ 2020 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 01 පරිච්ඡේදයේ 1.1 හැඳින්වීම යටතේ සඳහන් කර ඇති රජය සතු ව්‍යාපාර 396 ක් පවතින බවත් ඉන් 280 ක් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන බවත් දක්වා තිබුණි.කෙසේ වුවද දෙපාර්තමේන්තුව විසින්ම විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රජය සතු ව්‍යාපාර 117 ක් පවතින බවත් ඉන් දෙපාර්තමේන්තුව විසින් ආයතන 300 ක් අධීක්ෂණය කරනු ලබන බවත් දක්වා තිබුණි.

(ඇ) එසේ වුවද, ඉහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර 300 න් 118 ක් පමණක් මේ වනවිට දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය කෙරෙමින් පවතින බව විගණනයට දන්වා තිබුණි.

(ඈ) එම රාජ්‍ය ව්‍යාපාර 118 තුළ අලාභ ලබමින් පවතින ආයතන 33 ක් විය. ආයතන අලාභ ලබා ඇති විට ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම කෙසේද යන්න පිළිබඳව විගණනයෙන් විමසා සිටියද, ඊට පිළිතුරු ලෙස අවශ්‍ය උපදෙස් සැපයීම හා ආයතන ලැහුවත් කිරීම සිදුකරන බව දන්වා තිබුණද, ඊට අදාළ පසුවිපරම් සිදුකිරීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඉ) විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරමින් පැවති ව්‍යාපාර 118 න් ආයතන 18 ක මූල්‍ය ප්‍රකාශන හෝ ඉදිරිපත් වී නොමැති බව විගණනයට දන්වා තිබුණු අතර ඉන් සමහර ආයතනවල වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රකාශනද ඉදිරිපත් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

I. **2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොමැති ක්‍රියාකාරකම්**

i. ක්‍රියාකාරී සැලැස්මේ 1.3 යටතේ දක්වා ඇති පරිදි රජය සතු ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද පරිපාලන සංග්‍රහයන් (Administrative Manual) සඳහා අනුමැතිය ලබාදීම.

ii. සාමූහික ගිවිසුම් (Collective Agreement) අවසන් කිරීම සඳහා පහසුකම් සැපයීම,

iii. සමාගම් පනත, යහපාලන මාර්ගෝපදේශ විගණිත හා කළමනාකරණ කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම,

**II. 2019 කාර්යසාධන වාර්තාව අනුව, 2019 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු තුළ අවසන් කිරීමට සැලසුම් කර තිබූ 2020 වර්ෂය අවසාන වනවිටත් සම්පූර්ණ කර නොමැති ක්‍රියාකාරකම් පහත පරිදි විය,**

i. ලාභාංශ ප්‍රතිපත්තිය

ii. ප්‍රසාද දීමනා ප්‍රතිපත්තිය

iii. යහපාලනය පිළිබඳ යාවත්කාලීන මාර්ගෝපදේශ සංග්‍රහය

